# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 229/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 08/02/2024 පැය 1910

## මාධ්‍ය නිවේදනය

**ළමයින්ට හා කාන්තාවන්ට පොදු ප්‍රවාහන සේවාවන්වලදී සිදු වන ලිංගික හිංසනයන් මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වූ මෙහෙයුම - පොලිස් මූලස්ථානය.**

පොදු ප්‍රවාහන සේවාවන් වලදී ළමයින්ට හා කාන්තාවන්ට සිදු වන ලිංගික හිංසනයන් මැඩපැවැත්වීම සඳහා වූ නියමු ව්‍යාපෘතියක් 2024.02.07 වන දිනය තුල දිවයින පුරා බල පැවැත්වෙන පරිදි පොදු ප්‍රවාහන සේවා, මහජනතාව වැඩි වශයෙන් ගැවසෙන වීදි, බස් නැවතුම් පල, දුම්රිය ස්ථානයන් මූලික කරගෙන ක්‍රියාවට නංවන ලදි.

මෙම මෙහෙයුම සඳහා සිවිල් ඇඳුමින් සැරසුන පොලිස් නිලධාරීන් කණ්ඩායමක් යොදවමින් ක්‍රියාත්මක කර ඇති අතර, එම මෙහෙයුම මඟින් සිදු කල වැටලීම් වලදී පහත පරිදි අත්අඩංගුවට ගැනීම් සිදු කර ඇත.

- පොදු ප්‍රවාහන සේවය තුලදී ලිංගික අතවර සිදු කර ඇති පුද්ගලයින් අත් අඩංගුවට ගත් සංඛ්‍යාව — 18
- වෙනත් ස්ථාන වලින් අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව — 03
- ගැටකපන්නන් අත්අඩංගුවට ගත් සංඛ්‍යාව — 05
- මත්ද්‍රව්‍ය භාවිතය මත අත්අඩංගුවට පුද්ගලයින් සංඛ්‍යාව — 03
- සැකපිට අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව — 13

මෙම ව්‍යාපෘතිය ළමුන්ට හා කාන්තාවන්ට සිදු වන හිංසනයන් මැඩපැවැත්වීම සඳහා සෑම සතියකම අවස්ථානුකූලව ක්‍රියාවට නංවනු ලබන අතර පොදු ප්‍රවාහන සේවාවන්ට අමතරව මහජනතාව වැඩි වශයෙන් ගැවසෙන වීදි, බස් නැවතුම් පල, දුම්රිය ස්ථානයන් හිද මෙම මෙහෙයුම් සිදු කිරීමට කටයුතු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**